**පොල් සංවර්ධන අධිකාරිය**
**අංක 54, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.**

## ඉතිහාසය කෙටියෙන්

1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ විධිවිධානයන්ට හා එයට අදාල එක් එක් සංශෝධනයන්ට අදාලව (එනම් 1975 අංක 24, 1984 අංක 45 (විශේෂ ගිවිසුම), 1986 අංක 7, 1986 අංක 8, 1987 අංක 40, 2003.05.12 වන දින අතිරේක වශයෙන් නිකුත් කරන ලද සංශෝධනය) සහ1979 දෙසැම්බර් 31 වන දින අංක 69/4 අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කිරීමට යටත්ව පොල් සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇති බලතල අනුව එහි කාර්යයන් සිදුකරනු ලැබේ.

එමෙන්ම පොල් සංවර්ධන අධිකාරියට හිමිවූ මෙම බලතල ප්‍රකාරව, පිරිසැකසුම්, තත්ව පාලන හා තත්ව ආරක්ෂණ, දේශීය හා විදේශීය වශයෙන් අලෙවි සංවර්ධන හා පර්යේෂණ යන ක්ෂේත්‍රයන්හි සහ කර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේදී අමාත්‍යතුමන්ට සහාය දැක්වීම යනාදී අනෙකුත් අනුබද්ධිත කාර්යයන්හිදී කර්මාන්තය සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් නියාමන බලතල භාවිතය, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම, මගපෙන්වීම, තාක්ෂණය ලබාදීම, ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන අනුමැතීන් සහ මූල්‍යාධාර ලබාදීම යනාදී කාර්යයන්වලද නිරත වේ.

පොල් සංවර්ධන අධිකාරිය පිහිටුවීමට පෙර මුල් අවධියේ පොල් මණ්ඩලය නමින් ස්ථාපිත කර පසුකාලීනව එය පොල් සැකසුම් මණ්ඩලය, කෙදි මණ්ඩලය හා පොල් අලෙවි මණ්ඩලය ලෙස විමධ්‍යගත කරන ලදී. පසුව එම සියළුම ආයතන එක්කොට 1980 දී පොල් සංවර්ධන අධිකාරිය නමින් වර්තමාන ආයතනය ඉහත සඳහන් පනත් හා සංශෝධනයන්ට සහ අති විශේෂ ගැසට් පත්‍රයන්ට යටත්ව කර්මාන්තය සම්බන්ධ ප්‍රධාන ආයතනය වශයෙන් පිහිටුවන ලදී.

මෙයට අමතරව පිරිසැකසුම්, තත්ව පාලනය හා තත්ව ආරක්ෂණය, අලෙවිකරණය යනාදී අංශයන්ට අදාලව, කර්මාන්තයේ නිරත සුළු, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යවසායකයින් සම්බන්ධ සංවර්ධන හා පහසුකම් සැලසීමේ කටයුතු, අධීක්ෂණ හා නියාමන කටයුතු ආදී ඍජු මෙහෙයුම් කාර්යයන්හිදී සහ සමස්ත කර්මාන්තයේ උන්නතිය සඳහා වගකීම දැරීමට පොල් සංවර්ධන අධිකාරිය වෙත බලතල පැවරී ඇත.

### ප්‍රධාන අංශ

**මෙහෙයුම් අංශ**

- අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය
- සැකසුම් සංවර්ධන අංශය
- තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය

**සේවා අංශ**

- පාලන අංශය
- මුදල් අංශය

## ආයතනික පරමාර්ථ

- ප්‍රතිපත්ති සකස් කිරීමේදී හා පොල් කර්මාන්තය සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා නිර්ණය කිරීමේදී අමාත්‍යවරයාට සහ අමාත්‍යාංශයට සහය දැක්වීම හා උපදෙස් ලබා දීම.

- පොල් කර්මාන්තයේ දිගු කාලීන වාණිජ්‍යමය, ලාභදායී පැවැත්ම සඳහා සංවර්ධන කටයුතු සිදුකිරීම.
- ගෘහස්ථ අවශ්‍යතාවයන් වන පොල් හා පොල් තෙල් සාධාරණ මිල ගණන් යටතේ පවත්වා ගැනීම.
- ගෘහස්ථ පාරිභෝජනයේදී සිදුවන අපතේ යාම් අවම කිරීම් මගින් පිරිසැකසුම් කර්මාන්තය සඳහා උපරිම පොල් ප්‍රමාණයක් ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනයෙන් හා අපනයනය කිරීමෙන් උපරිම නිෂ්පාදන අලෙවිකරණ විවිධාංගීකරණය අත්පත් කර ගැනීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් උපයා ගැනීම (කල්යත්ම රු. බිලියන 20 සිට රු. බිලියන 40 දක්වා ඉහළ නැංවීම මගින්)
- ග්‍රාමීය මට්ටමේ රැකියා ඇතිකිරීම මගින් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වයක් ලබාදීම.
- උසස් තත්වයේ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

**ආයතනයේ කාර්යයන්**

- පිරිසැකසුම් ඒකක හා නියැදි පොල් ආශ්‍රිත නිෂ්පාදිතයන් හි අවශ්‍ය ප්‍රමිතීන් පවත්වා ගැනීම සම්බන්ධ අධීක්ෂණ කටයුතු.
- පොල් ආශ්‍රිත නිෂ්පාදිතයන් හි අවශ්‍ය ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම පිණිස අපනයන තොගවලින් ලබාගන්නා ලද නියැදි පරීක්ෂා කිරීම.
- අපනයන තොග සඳහා තත්ව සහතික නිකුත් කිරීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහය ලබාදීම.
- පිරිසැකසුම් කර්මාන්තශාලා නවීකරණය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යාධාර සැපයීම.
- අගය එකතු කරන ලද පොල් ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික හා මූල්‍යාධාර සැපයීම.
- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පවත්නා වර්තමාන වෙළඳපල තොරතුරු ලබා දීම.
- පොල් හා කොප්පරා ආශ්‍රිත වෙන්දේසි පැවැත්වීම මගින් ජාත්‍යන්තර හා අභ්‍යන්තර අලෙවිකරණ ක්‍රම සඳහා පහසුකම් සැලසීම.
- වෙළඳපොළවල්, ප්‍රදර්ශණය ආදියට සහභාගී වීම මගින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධන කිරීම.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංකය | ෆැක්ස් | ඊ - මේල් |
|---|---|---|---|
| සභාපති, ශ්‍රී වීරසිංහ මහතා | 011-2502501 | 011-2508729 | chairmancda@sltnet.lk |
| අධ්‍යක්ෂ ජනරාල් | 011- 2508730 | | |
| පොදු දුරකථන අංක | 011-2502502-4 | 2368284-5<br>2368982-3 | |

**වෙබ් අඩවිය:** www.cda.lk